# ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්හි වෙනත් නිර්දේශ...

**ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්**
ඉමිඩක්ලෝප්‍රිඩ් 200 ග්‍රෑ/ලී එස් එල්

| බෝගය | මර්දනය වන පළිබෝධකයින් |
|---|---|
| එළවළු | පැල මැක්කන් |
| මිරිස්, මාළු මිරිස් | කොළ කොඩවීම පතුරුවන කුඩිත්තන්, පැල මැක්කන් සහ සුදු මැස්සන් |
| අර්තාපල් | ග්‍රීන් පීච් කුඩිත්තන්, පැළ මැක්කන් |
| බටු | කොරපොතු කෘමීන් හා පිටි මකුණන් |
| මාෂ බෝග | කුඩිත්තන්, කොරපොතු කෘමීන් හා පිටි මකුණන් |
| විසිතුරු බෝග හා කැපූ මල් | කුඩිත්තන්, සුදු මැස්සන් සහ කොරපොතු කෘමීන් |
| පොල් | තවාන් හා පැලවලට හානිකරන වේයන් |
| අඹ | පත්‍ර කීඩෑවන් |
| බෝංචි, මෑ, ගෝවා, තක්කාලි, බණ්ඩක්කා සහ කරවිල, පතෝල, පිපිඤ්ඤා, වට්ටක්කා ආදී කුකබිටේසි කුලයේ බෝග ඇතුළු අනෙකුත් වගාවන් | පැල මැක්කන්, කොරපොතු කෘමීන්, සුදුමැස්සන්, කුඩිත්තන් |

මී මැස්සන් වඩාත් ක්‍රියාකාරී අවස්ථාවල (උදේ සහ සවස) ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ් යෙදීමෙන් වළකින්න. පළිබෝධනාශක යෙදීමේදී හානිය නිවැරදිව හඳුනාගෙන නිර්දේශිත පළිබෝධනාශක භාවිතා කරන්න. සැමවිටම ලේබලයේ උපදෙස් කියවා නිසි ලෙස පිළිපදින්න.

Hayleys AGRICULTURE

ලියාපදිංචිය
හේලීස් ඇග්‍රිකල්ච හෝල්ඩින්ස් ලිමිටඩ්
25, ෆොස්ටර් පටුමග, කොළඹ 10,
දුරකථන: 0112 688960-3 / ෆැක්ස්: 0112 697202

**පළිබෝධනාශක අනතුරු සහිතයි. ප්‍රවේශමෙන් පරිහරණය කරන්න.**

# වී වගාවේ දුඹුරුපැළ කීඩෑ හානිය මර්දනයට

BAYER

**ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්**
ඉමිඩක්ලෝප්‍රිඩ් 200 ග්‍රෑ/ලී එස් එල්

# ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්

## ඉමිඩක්ලෝප්‍රිඩ් 200 ග්‍රෑ/ලී එස් එල්

එක්වරක් යෙදුවත් කීඩෑවන්ගෙන් ආරක්ෂාව

මිල රු. 1,250/= සිට ඉහලට




මෙය පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අනුමැතිය ලත් විස්තර පත්‍රිකාවකි. අංකය : ROP / L1 / 151105

Admire® is the registered trademark of Bayer AG, Germany

Hayleys AGRICULTURE

CNI Chloronicotinyl Insecticides — Innovative Pest-Management. Invented by Bayer.

Bayer CropScience

**ඒකාබද්ධ පළිබෝධ මර්දන ක්‍රම භාවිතයෙන් පළිබෝධනාශක යෙදීම අවම කරගන්න.**

# වී වගාවේ විවිධ කීඩෑ වර්ග

**ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්**
ඉමිඩක්ලෝප්‍රිඩ් 200 ග්‍රෑ/ලී එස් එල්


දුඹුරු පැළ කීඩෑවා


පිටසුදු පැළ කීඩෑවා


සිහින් දුඹුරු පැළ කීඩෑවා


කොළ පත්‍ර කීඩෑවා


අත් වක් පත්‍ර කීඩෑවා

## දුඹුරුපැළ කීඩෑවාගේ හානිය දෙයාකාරයි

**(1) ගොයම් පැළ මත විශාල සංඛ්‍යාවලින් බෝවී කීඩෑ පිළිස්සීම ඇතිකරයි. කීඩෑවන්ගෙන් හානිවූ ගොයම් පැළ පළමුව කහ පැහැයක් ගන්නා අතර පසුව දුඹුරු පැහැයට හැරී වියළී මියයයි.**


කීඩෑවන් හානිකල වී වගාවක්

**වගාවෙහි සුළු ප්‍රදේශයකින් පටන් ගන්නා හානිය කවාකාර හැඩයට විශාල ප්‍රදේශ දක්වා පැතිරීයාම නිසා මෙවැනි ප්‍රදේශ කීපයක් එකට සම්බන්ධවීමෙන් මුළු වගාවම විනාශ වී යයි.**

**(2) දුඹුරු පැළ කීඩෑවා කඳ මත සිට යුෂ උරාබීම නිසා සිදුවන කීඩෑ පිළිස්සුමට අමතරව තෘණාකාර කුරුවීම, කඩමළුවන් කුරුවීම හා මළානික කුරුවීම යන වෛරස් රෝගවල වාහකයා ලෙසද ක්‍රියාකරයි.**


දුඹුරු පැළ කීඩෑවන්


තෘණාකාර කුරුවීම


කඩමළුවන් කුරුවීම

**පැළ කීඩෑවන් බොහෝවිට වී ශාකයේ පාදස්ථ ප්‍රදේශවල ජීවත්වන අතර පත්‍ර කීඩෑවන් ජීවත්වන්නේ බොහෝවිට ශාකයේ අග්‍රස්ථ පත්‍රවලයි.**

# වී වගාවේ දුඹුරුපැළ කීඩෑවන් මර්දනය

**ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්**
ඉමිඩක්ලෝප්‍රිඩ් 200 ග්‍රෑ/ලී එස් එල්

**කීඩෑ හානිය මර්දනයට ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ් නිර්දේශිතය.**

| මිශ්‍රණය (ජලය ලී. 10 කට) | මිශ්‍රණය (ජලය ලී. 16 කට) | යෙදිය යුතු ප්‍රමාණය |
|---|---|---|
| මි. ලී. 5 | මි. ලී. 8 | හෙක්ටාරයකට මි. ලී. 160-200 (අක්කරයකට මි. ලී. 64-80) |
| පඳුරු දමන අවධියේ එක් පඳුරක කීඩෑවන් 5-8 කට වඩා සිටීනම් හෝ මේරූ පඳුරක නම් එක් පඳුරක කීඩෑවන් 8-10 පමණ සිටීනම් කෘමිනාශක යොදන්න. කෘමිනාශක යොදන විට ගොයමේ පාමුලට වැදෙන සේ යොදන්න. | | |

**පෙර අස්වනු කාලය දින 14 යි.**

වගාව තුලට හිරු එළිය වැටීමට සැලැස්වීම, කුඹුරේ ජලය කපා හැරීම සහ බී.ජී. 300 වැනි ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම මගින්ද කීඩෑවන් පාලනය කල හැකිය.

## ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්හි සුවිශේෂ ක්‍රියාකාරීත්වය

- ජර්මනියේ බේයර් ක්‍රොප්සයන්ස් ආයතනයේ නිශ්පාදනයක් වන ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ් ස්පර්ශයීය හා ආමාශගත විෂවීමේ ක්‍රියාකාරීත්වයකින්ද කෘමිනාශකයකි.
- සංස්ථානික කෘමිනාශකයක් වන ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ් ගොයම් ගස මගින් උරාගෙන ශාකය තුල හොඳින් සංසරණය වේ. මේ නිසා යුෂ උරාබොන කීඩෑවන් පාලනය කර ගොයම් ශාකය ආරක්ෂා කර දෙයි.
- ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ් වගාවට කීපවරක් යෙදීමට අවශ්‍ය නොවන අතර ශාකයේ රැඳී පැවතිමින් කීඩෑවන්ගේ හානිය අවම කිරීමද සිදුකරයි.